# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2159/38 - 2020 ජනවාරි මස 23 වැනි බ්‍රහස්පතින්දා - 2020.01.23**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(5) යටතේ විෂයයන් හා කාර්යයන් පැවරීම

අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන රාජ්‍ය අමාත්‍යවරුන් සඳහා විෂයයන් හා කාර්යයන් පැවරීමට අතිගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද අංක : 19/3391/201/005 දරන අමාත්‍ය මණ්ඩල සන්දේශයට, 2019.12.10 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී ලැබුණු එකඟතාවය හා අනුමැතිය මත අභ්‍යන්තර වෙළඳ සහ පාරිභෝගික සුබසාධන රාජ්‍ය අමාත්‍ය ගරු අනුර ප්‍රියදර්ශන යාපා මැතිතුමා භාරයේ පැවතිය යුතු විෂයයන්, කාර්යයන්, දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතන මෙහි පහත දැක්වෙන උපලේඛනයෙහි සඳහන් පරිදි විය යුතු බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 (5) පරිදි මෙයින් නිවේදනය කරනු ලැබේ.

චමල් රාජපක්ෂ,
අභ්‍යන්තර වෙළඳ ආහාර සුරක්ෂිතතාවය සහ පාරිභෝගික සුබසාධන අමාත්‍ය.

2020 ජනවාරි මස 07 වැනි දින.

**උපලේඛනය**

**අභ්‍යන්තර වෙළඳ සහ පාරිභෝගික සුබසාධන රාජ්‍ය අමාත්‍ය**

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 1. දේශීය වෙළඳපොල තුල පාරිභෝගික භාණ්ඩ ගුණාත්මක මට්ටමෙන් හා හිඟයකින් තොරව සාධාරණ මිල ගණන් වලට සැපයීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.<br>2. පාරිභෝගික භාණ්ඩ වලට අදාළ වන ජාතික මිල ප්‍රතිපත්ති සම්පාදනය සහ ක්‍රියාවෙහි යෙදවීම. | 1. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය<br>2. සීමාසහිත ලංකා සතොස<br>3. සීමාසහිත ලංකා ජෙනරල් ට්‍රේඩිං සමාගම<br>4. සමුපකාර තොග වෙළඳ සංස්ථාව | • පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනත (2003 අංක 9)<br>• පාරිභෝගිකයා ආරක්ෂා කිරීමේ පනත (1979 අංක 1) |

**උපලේඛනය** (සම්බන්ධිතයි)

**අභ්‍යන්තර වෙළඳ සහ පාරිභෝගික සුබසාධන රාජ්‍ය අමාත්‍ය**

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
| 3. වෙළඳපොල තරඟකාරීත්වය තහවුරු කරමින් වෙළඳපොල තුළ අවිධිමත් ලෙස භාණ්ඩ ඌණතාවය ඇති වීම අවම කරමින් හා ස්වයං නියාමනය දිරිමත් වන පරිදි ක්‍රියාමාර්ග ගැනීම. | | |
| 4. ප්‍රමිතියෙන් යුත් භාණ්ඩ අවම තරඟකාරී මිල ගණන් වලට අඛණ්ඩව සැපයෙන හා සැපයුම් කරුවන්ගේ සමපේක්ෂණ හැසිරීම් වළක්වා ගනිමින් පාරිභෝගික ආරක්ෂණය සඳහා ක්‍රියාමාර්ග ගැනීම. | | |

02 - 91

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.